# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පළාත් සභා මැතිවරණ (සංශෝධන)

1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ
පනත් කෙටුම්පතකි

---

යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්
2023 අප්‍රේල් මස 25 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 අප්‍රේල් මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[174 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 10.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මෙම පනත 2023 අංක  දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත අහෝසි කිරීම**

**2.** 2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත මෙයින් අහෝසි කරනු ලැබේ.

**2017 සැප්තැම්බර් මස 21 වන දින බලපැවැත් වූ 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනතේ ප්‍රතිපාදන වලංගුව පවතින බව**

**3.** සියලු හේතු සහ කාරණා සඳහා 2017 සැප්තැම්බර් මස 21 වන දින බලපැවැත්වූ 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනතේ ප්‍රතිපාදන වලංගුව පැවතුන බව සහ වලංගුව පවතින බවත්, 2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත මඟින් සංශෝධන නොවූ ලෙස සැළකිය යුතු ය.

**2017 සැප්තැම්බර් මස 22 වන දිනට පසුව සිදුකරන ක්‍රියා**

**4.** 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව, 2017 සැප්තැම්බර් මස 22 වන දිනට පසුව සිදු කරන ලද හෝ සිදු කිරීමට තැත්කරන ලද කුමන හෝ ක්‍රියාවක් අවශ්‍ය සංශෝධන සහිතව 2017 සැප්තැම්බර් මස 21 වන දින බලපැවැත්වූ 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව සිදු කළේ යැයි සැළකිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.